ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

මොඩියුල අංකය - 09

# විසිඑක්වන සියවසේ පාසල

ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය

# ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

## මොඩියුල අංකය - 09

## විසි එක්වන සියවසේ පාසල

| | |
|---|---|
| මොඩියුලයේ නම | විසි එක්වන සියවසේ පාසල |
| මොඩියුලයේ අරමුණු | 1. වර්තමාන හා අනාගත අධ්‍යාපන පරිසරයේ හැසිරීම හා භාවිතයන් හඳුනාගැනීම.<br>2. විසිඑක්වන සියවසේ පාසල් අධ්‍යාපනයේ තාක්ෂණ භාවිතයන් පිළිබඳ පරිචය හා සීමා හඳුනාගැනීම.<br>3. අනාගත පාසල් පරිසරයේ අවශ්‍යතා හා සැසඳෙන පරිදි වර්තමාන පාසල ව්‍යුහාත්මක හා කෘත්‍යාත්මක වශයෙන් ප්‍රතිනිර්මාණයට දායක වීම.<br>4. අනාගත පාසල් අධ්‍යාපන පරිසරයේ මානව සබඳතා ප්‍රශස්ත ලෙස පවත්වා ගනිමින් නව්‍ය ඉගෙනුම් පරිසරයේ සමාජීය වෙනස්කම් නිවැරදි ලෙස දිශානත කර භාවිත කිරීම. |
| අපේක්ෂිත ඉගෙනුම් පල | 1. අනාගත පන්ති කාමරයට/ ඉගෙනුම් පරිසරයට අනුකූල වන සේ සිසුන් සඳහා ගුරුවරු පූර්වගාමී සූදානමකට පෙළඹෙයි.<br>2. අධ්‍යාපනය සඳහා පාසල සූදානම් කිරීමේ දී නව පන්නයේ සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ ප්‍රතිමාන හා එම ප්‍රතිමාන සිසුන් තුළ වර්ධනයට ගුරුවරයා සූදානම් වෙයි.<br>3. කාර්යාල ක්‍රමය තොරතුරු ජනනය කිරීමේ හා කෘතිම බුද්ධිය පදනම් වූ කාර්යාල ව්‍යවහාරවල අවශ්‍යතාව අවබෝධ කරගෙන විස්තර කරයි.<br>4. ඩිජිටල්කරණයේ අතත්‍ය හා දුරස්ථ ප්‍රවේශ නැඹුරුතා පිළිබඳව අවබෝධ කරගනිමින් අදාල පරිපාලන ව්‍යවහාර පිළිබඳව සිසුන් තුළ පරිශීලක හැකියා ඇති කිරීමට ගුරුවරයා හැඩ ගැසෙයි.<br>5. අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය නොවෙනස්ව තොරතුරු තාක්ෂණය හා ඩිජිටල් භාවිත යොදාගනිමින් ක්‍රියාත්මක කිරීමේ පැතිකඩක් සිසුන් තුළ නිර්මාණය කරවීම පිළිබඳව නිපුණතා අත්පත් කර දෙයි.<br>6. පාසලක තත්ත්ව අණාවරණය කරගෙන එම තත්ත්ව හා අපේක්ෂිත තත්ත්ව අතර පවතින පරතර පිළිබඳව අවධානය යොමු කර ඒ සඳහා විසඳුම් ප්‍රමුඛතා අනුව පෙළ ගස්වා ගනියි.<br>7. පවතින පරතර පියවීම පිළිබඳව උපක්‍රමික සැලසුම් සකස් කිරීමේ හැකියාව ප්‍රගුණ කර ඒ අනුව ක්‍රියාත්මක වෙයි.<br>8. විසිඑක්වන සියවසට ගැළපෙන පරිදි පාසල් ප්‍රජාව යොමු කිරීමට අවශ්‍ය නව තාක්ෂණික ව්‍යවහාර හඳුනාගෙන අත්පත් කර ගැනීමට අදාළ පියවර ගනියි.<br>9. අදාළ භාවිතාවන්හි සීමා අනුව බහුවිධ ව්‍යවහාර ස්වකීය ගුරු භූමිකාව තුළ ඒකාබද්ධව ප්‍රශස්ත ලෙස භාවිත කරයි.<br>10. විසිඑක්වන සියවසට ගැළපෙන සේ ගුරු- සිසු, සිසු- සිසු, ගුරු- ගුරු, හා ගුරු- කළමනාකරණ සම්බන්ධතා පිළිබඳ පුරෝකථනය කරයි.<br>11. පාසල හා ප්‍රජාව අතර ප්‍රශස්ත සම්බන්ධතාව බලවත් විපර්යකාරකයක් ලෙස හඳුනාගෙන 21 සියවසේ අවශ්‍යතා සපුරාගැනීමට සන්නිවේදනයේ යෙදෙයි.<br>12. සම්ප්‍රදායික මානව සම්බන්ධතා උපයෝගි කරගනිමින් සියලු ප්‍රජා සබඳතා ගොඩනගන ආකාරය හා ඩිජිටල් සබඳතා ජාලය තුළ ආචාරධර්ම හැසිරවීම අවබෝධ කරගෙන විස්තර කරයි. |

| | |
|---|---|
| මොඩියුලයේ අන්තර්ගතය | 1. අනාගත පාසල එහි භෞතික ලක්ෂණ හා වෙනස්විය යුතු පසුබිම<br>• පන්ති කාමරයේ/ ඉගෙනුම් පරිසරයේ ස්වභාවය<br>• සනීපාරක්ෂක පහසුකම්<br>• කාර්යාල ක්‍රමය<br>• පරිපාලන ව්‍යවහාර<br>• භෞතික සැකසුම<br>2. විසිඑක්වන සියවසේ පාසලක් බවට පරිවර්තනය<br>• පාසල් තත්ත්ව අනාවරණය<br>• පරතරය හඳුනා ගැනීම<br>• පරතරය පියවා ගැනීම<br>3. විසිඑක්වන සියවසට තාක්ෂණික වශයෙන් පාසල සූදානම් කිරීම.<br>4. විසිඑක්වන සියවසේ පාසල් පරිසරයේ මානව සම්බන්ධතා<br>• ගුරු - ශිෂ්‍ය සබඳතාව<br>• ශිෂ්‍ය- ශිෂ්‍ය සබඳතා<br>• ගුරු - ගුරු සබඳතා<br>• ගුරු කළමනාකරණ සම්බන්ධතා<br>• පාසල ප්‍රජාව අතර සම්බන්ධය<br>• නව මානව සබඳතා<br>ඉහත අන්තර්ගතයට අදාළ ව වැඩිදුර අධ්‍යයනය නිර්දේශ කෙරේ. |
| ඉගෙනුම් ක්‍රමවේදය | ස්වයං අධ්‍යයනය |